කතිරයේ බලය

මැතිවරණ කොමිෂන් සභාව

ISSN-2706-0047

2024 මැයි - අගෝස්තු 8 වන වෙළුම 2 වන කලාපය

ශ්‍රී ලංකාවේ ජනාධිපතිවරණ

චන්න පී.ද. සිල්වා, අධ්‍යක්ෂ (පර්යේෂණ හා ක්‍රමසම්පාදන)
මැතිවරණ කොමිෂන් සභාව

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 30 වන ව්‍යවස්ථාව අනුව රජයේ ප්‍රධානියා ද, විධායකයේ ප්‍රධානියා ද, ආණ්ඩුවේ ප්‍රධානියා ද, සන්නද්ධ සේවාවන් හි සේනාධිනායකයා ද වන විධායක ජනාධිපතිවරයා ජනතාවගේ ඡන්දයෙන් තෝරාපත් කර ගැනේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ හා 1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරාපත් කර ගැනීම පිළිබඳ පනතේ සඳහන් විධිවිධාන මෙම ඡන්ද විමසීම් ක්‍රියාවලියට අදාළ ප්‍රධානතම නීති සංග්‍රහය වේ. 1978 දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් හඳුන්වා දෙන විධායක ජනාධිපති ධූරය සඳහා සුදුස්සෙකු තෝරාපත් කර ගැනීම සඳහා ප්‍රථම වරට ඡන්ද විමසීමක් පවත්වන ලද්දේ 1982 වර්ෂයේ දී ය. ඉන් අනතුරුව පිළිවෙලින් 1988, 1994, 1999, 2005, 2010, 2015 හා 2019 වර්ෂවල දී ජනාධිපතිවරණ ඡන්ද විමසීම් 08ක් පවත්වා තිබේ. 2024.09.21 වන දින පැවැත්වීමට නියමිතව ඇත්තේ ශ්‍රී ලංකාවේ 9 වන ජනාධිපතිවරයා තෝරාපත් කර ගැනීමේ ඡන්ද විමසීමයි.

1977 පවත්වන ලද පාර්ලිමේන්තු මැතිවරණයෙන් තේරී පත් වූ රජය විසින් 1978 සැප්තැම්බර් මස 07 වන දින ප්‍රථම ජනරජ ව්‍යවස්ථාව වෙනුවට ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්මත කර ගන්නා ලදී. නව ව්‍යවස්ථාවෙන් තනි ව්‍යවස්ථාදායකයක් හා මහජන ඡන්දයෙන් පත්වන විධායක ජනාධිපතිවරයෙකු හඳුන්වා දෙන ලදී. එම ව්‍යවස්ථාව අනුව මැතිවරණ කොට්ඨාසවලින් සමානුපාතික නියෝජනය මගින් පත්වන මන්ත්‍රීවරුන් 196 කින් යුත් පාර්ලිමේන්තුවක් බිහිවිය.

පාර්ලිමේන්තුවේ උත්තරීතරීභාවය ඉවත් කොට ජනතාව විසින් තෝරා පත්කර ගනු ලබන විධායක ජනාධිපතිවරයෙකු යටතට රාජ්‍ය පත් කිරීම මෙම නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් හඳුන්වා දෙනු ලැබූ මූලික අංගයකි. එයට අමතරව, ජනාධිපති රජයේ ප්‍රධානියා ද, විධායකයේ ප්‍රධානියා ද, ආණ්ඩුවේ ප්‍රධානියා ද, සන්නද්ධ සේවාවන්හි සේනාධිනායකයා ද වීම [30(1)], අමාත්‍ය මණ්ඩලය පත් කිරීම හා ඕනෑම අමාත්‍ය ධූර ගණනක් දැරීමට හැකි වීම හා අමාත්‍යවරුන් සංඛ්‍යාව, අමාත්‍යාංශ සංඛ්‍යාවට හා විෂය පථය හා ආයතන කාර්යයන් තීරණය කිරීම [44(1),(4)], කැබිනට් නොවන අමාත්‍යවරුන් හා නියෝජ්‍ය අමාත්‍යවරුන් පත් කිරීම [45(6), 46(1)], අමාත්‍යාංශ ලේකම්වරුන් ඇතුළු රාජ්‍ය නිලධාරීන් පත් කිරීම, [41(11)] ඔවුන් සේවයෙන් පහ කිරීම ඇතුළු විනය බලතල හිමි වීම. [41(3)]. යන සංශෝධන මෙම ව්‍යවස්ථාවේ විශේෂ ලක්ෂණ ලෙස හඳුන්වාදීමට පිළිවන.

මේ වන විට මෙම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව 22 වතාවක් සංශෝධනයට ලක් වී ඇත.

මෙම 1978 සම්මත කර ගන්නා ලද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නීතිමය ප්‍රතිපාදන මත ඒ වන විට අග්‍රාමාත්‍ය ධූරය හෙබ වූ ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා ශ්‍රී ලංකාවේ ප්‍රථම විධායක ජනාධිපතිවරයා ලෙස ධූරයේ දිවුරුම් දීම සිදු කරන ලදී.

පළමු ජනාධිපතිවරණය - 1982

ජනාධිපතිවරයා විසින් අභිලාෂය ප්‍රකාශ කිරීම
1982 අගෝස්තු 27

ජනාධිපතිවරණ පනතේ 2වන වගන්තිය යටතේ ප්‍රකාශය
1982 අගෝස්තු 30

නාමයෝජනා භාර ගැනීමේ දිනය
1982 සැප්තැම්බර් 10

ඡන්ද විමසීම පැවති දිනය
1982 ඔක්තෝම්බර් 20

ලියාපදිංචි ඡන්ද සංඛ්‍යාව (1981 නාමලේඛනය අනුව)
8,145,015

තැපැල් ඡන්ද සංඛ්‍යාව
119,707

නාමයෝජනා භාරදුන් අපේක්ෂකයන්
එච්.එස්.ආර්.බී.කොබ්බෑකඩුව මහතා-ශ්‍රී ලංකා නිදහස් පක්ෂය
ජේ.ආර්. ජයවර්ධන මහතා - එක්සත් ජාතික පක්ෂය
ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා - ලංකා සමසමාජ පක්ෂය
වාසුදේව නානායක්කාර මහතා - නව සමසමාජ පක්ෂය
ජී.ජී. පොන්නම්බලම් මහතා - සමස්ත ලංකා ද්‍රවිඩ සංගමය
රෝහණ විජේවීර මහතා - ජනතා විමුක්ති පෙරමුණ

ප්‍රකාශිත ඡන්ද සංඛ්‍යාව	- 6,602,617 (81%)
ප්‍රතික්ෂේපිත ඡන්ද සංඛ්‍යාව	- 80,470 (1.21%)
වලංගු ඡන්ද සංඛ්‍යාව	- 6,522,147

ජයග්‍රාහී අපේක්ෂකයා හා ලබාගත් මුළු ඡන්ද සංඛ්‍යාව
ජේ.ආර්. ජයවර්ධන මහතා - එක්සත් ජාතික පක්ෂය
3,750,881 (52.91%)

දෙවන ජනාධිපතිවරණය - 1988

ජනාධිපතිවරණ පනතේ 2වන වගන්තිය යටතේ ප්‍රකාශය
1988 ඔක්තෝම්බර් 21

නාමයෝජනා භාර ගැනීමේ දිනය
1988 නොවැම්බර් 10

ඡන්ද විමසීම පැවති දිනය
1988 දෙසැම්බර් 10

ලියාපදිංචි ඡන්ද සංඛ්‍යාව (1988 නාමලේඛනය අනුව)
9,375,742

තැපැල් ඡන්ද සංඛ්‍යාව
82,613

නාමයෝජනා භාරදුන් අපේක්ෂකයන්
අබේසේකර ඔස්ටින් මහතා - ශ්‍රී ලංකා මහජන පක්ෂය
සිරිමාවෝ බණ්ඩාරනායක මැතිණිය - ශ්‍රී ලංකා නිදහස් පක්ෂය
ආර්. ප්‍රේමදාස මහතා - එක්සත් ජාතික පක්ෂය

ප්‍රකාශිත ඡන්ද සංඛ්‍යාව - 5,186,223 (55%)
ප්‍රතික්ෂේපිත ඡන්ද සංඛ්‍යාව - 91,445 (1.76%)
වලංගු ඡන්ද සංඛ්‍යාව - 5,094,778

ජයග්‍රාහී අපේක්ෂකයා හා ලබාගත් මුළු ඡන්ද සංඛ්‍යාව
ආර්. ප්‍රේමදාස මහතා - එක්සත් ජාතික පක්ෂය
2,569,195 (50.428%)

තුන්වන ජනාධිපතිවරණය - 1994

ජනාධිපතිවරණ පනතේ 2වන වගන්තිය යටතේ ප්‍රකාශය
1994 සැප්තැම්බර් 17

නාමයෝජනා භාර ගැනීමේ දිනය
1994 ඔක්තෝබර් 07

ඡන්ද විමසීම පැවති දිනය
1994 නොවැම්බර් 09

ලියාපදිංචි ඡන්ද සංඛ්‍යාව (1994 නාමලේඛනය අනුව)
10,945,065

නාමයෝජනා භාරදුන් අපේක්ෂකයන්
චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරණතුංග මහත්මිය - පොදුජන එක්සත් පෙරමුණ
ගාමිණී දිසානායක මහතා - එක්සත් ජාතික පක්ෂ්ය
හඩ්සන් සමරසිංහ මහතා - ස්වාධීන
හරිශ්චන්ද්‍ර විජයතුංග මහතා - සිංහලයේ මහ සම්මත භූමි පුත්‍ර පක්ෂය
ඒ.ජේ. රණසිංහ මහතා - ස්වාධීන
ගලප්පත්ති ආරච්චි නිහාල් මහතා - ශ්‍රී ලංකා ප්‍රගතිශීලී පෙරමුණ

ප්‍රකාශිත ඡන්ද සංඛ්‍යාව - 7,713,232 (70%)
ප්‍රතික්ෂේපිත ඡන්ද සංඛ්‍යාව - 151,706 (1.96%)
වලංගු ඡන්ද සංඛ්‍යාව - 7,561,526

ජයග්‍රාහී අපේක්ෂකයා හා ලබාගත් මුළු ඡන්ද සංඛ්‍යාව
චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරණතුංග මහත්මිය
පොදුජන එක්සත් පෙරමුණ
4,709,205 (62.27%)

හතරවන ජනාධිපතිවරණය - 1999

ජනාධිපතිවරණ පනතේ 2වන වගන්තිය යටතේ ප්‍රකාශය
1999 ඔක්තෝම්බර් 28

නාමයෝජනා භාර ගැනීමේ දිනය
1999 නොවැම්බර් 16

ඡන්ද විමසීම පැවති දිනය
1999 දෙසැම්බර් 21

ලියාපදිංචි ඡන්ද සංඛ්‍යාව (1998 නාමලේඛනය අනුව)
11,779,200

තැපැල් ඡන්ද සංඛ්‍යාව
190,000 (ආසන්න වශයෙන්)

නාමයෝජනා භාරදුන් අපේක්ෂකයන්
අබ්දුල් රසුල් මහතා - ශ්‍රී ලංකා මුස්ලිම් කච්චි
අල්විස් වීරක්කොඩි ප්‍රේමවර්ධන මහතා - බහුජන නිදහස් පෙරමුණ
ආරියවංශ දිසානායක මහතා - ප්‍රජාතන්ත්‍රවාදී එක්සත් ජාතික පෙරමුණ
එම්.ඩී. නන්දන ගුණතිලක මහතා - ජනතා විමුක්ති පෙරමුණ
කමල් කරුණාදාස මහතා - ජන විමුක්ති සහයෝගීතා පෙරමුණ
චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරණතුංග මහත්මිය - පොදුජන එක්සත් පෙරමුණ
ටෙනිසන් එදිරිසූරිය මහතා - ස්වාධීන
රනිල් වික්‍රමසිංහ මහතා - එක්සත් ජාතික පක්ෂය
රාජීව විජේසිංහ මහතා - ලිබරල් පක්ෂය
වාසුදේව නානායක්කාර මහතා - ප්‍රජාතන්ත්‍රවාදී වාමාංශික සන්ධානය
හඩ්සන් සමරසිංහ මහතා - ස්වාධීන
හරිශ්චන්ද්‍ර විජයතුංග මහතා - සිංහලයේ මහසම්මත භූමිපුත්‍ර පක්ෂය

ප්‍රකාශිත ඡන්ද සංඛ්‍යාව - 8,635,290 (73%)
ප්‍රතික්ෂේපිත ඡන්ද සංඛ්‍යාව - 199,536 (2.3%)
වලංගු ඡන්ද සංඛ්‍යාව - 8,435,754

ජයග්‍රාහී අපේක්ෂකයා හා ලබාගත් මුළු ඡන්ද සංඛ්‍යාව
චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරණතුංග මහත්මිය
පොදුජන එක්සත් පෙරමුණ
4,312,157 (51.11%)

හිටපු මැතිවරණ කොමසාරිස් චන්ද්‍රානන්ද සිල්වා මහතා මැතිවරණ ප්‍රතිඵල ප්‍රකාශයට පත් කරන අවස්ථාව

ජේ.ආර්.ජයවර්ධන මහතා, එච්.එස්.ආර්.බී.කොබ්බෑකඩුව මහතා හා රෝහණ විජේවීර මහතා නාමයෝජනා භාරදීමට පැමිණි අවස්ථාව

පස්වන ජනාධිපතිවරණය - 2005

ජනාධිපතිවරණ පනතේ 2වන වගන්තිය යටතේ ප්‍රකාශය
2005 සැප්තැම්බර් 19

නාමයෝජනා භාර ගැනීමේ දිනය
2005 ඔක්තෝම්බර් 07

ඡන්ද විමසීම පැවති දිනය
2005 නොවැම්බර් 17

ලියාපදිංචි ඡන්ද සංඛ්‍යාව (2004 නාමලේඛනය අනුව)
13,327,160

තැපැල් ඡන්ද සංඛ්‍යාව
323,176

නාමයෝජනා භාරදුන් අපේක්ෂකයන්
විමල් ගීගනගේ මහතා - ශ්‍රී ලංකා ජාතික පෙරමුණ
චමිල් ජයනෙත්ති මහතා - නව වාමාංශික පෙරමුණ
අජිත් කුමාර ජයවීර ආරච්චිගේ මහතා - එක්සත් ප්‍රජාතන්ත්‍රවාදී සන්ධානය
සිරිතුංග ජයසූරිය මහතා - එක්සත් සමාජවාදී පක්ෂය
පී. නෙල්සන් පෙරේරා මහතා - ශ්‍රී ලංකා ප්‍රගතිශීලී පෙරමුණ
විජේ ඩයස් මහතා - සමාජවාදී සමානතා පක්ෂය
අනුර ද සිල්වා මහතා - එක්සත් ලලිත් පෙරමුණ
අරුණ ද සොයිසා මහතා - රුහුණු ජනතා පක්ෂය
මහින්ද රාජපක්ෂ මහතා - එක්සත් ජනතා නිදහස් සන්ධානය
රනිල් වික්‍රමසිංහ මහතා - එක්සත් ජාතික පක්ෂය
අචල අශෝක සුරවීර මහතා - ජාතික සංවර්ධන පෙරමුණ
වික්ටර් හෙට්ටිගොඩ මහතා - එක්සත් ලංකා පොදුජන පක්ෂය
හේවා හීනිපැල්ලගේ ශාන්ත ධර්මද්වජ මහතා - එක්සත් ජාතික විකල්ප පෙරමුණ

ප්‍රකාශිත ඡන්ද සංඛ්‍යාව - 9,826,778 (73.70%)
ප්‍රතික්ෂේපිත ඡන්ද සංඛ්‍යාව - 109,739 (1.11%)
වලංගු ඡන්ද සංඛ්‍යාව - 9,717,039

ජයග්‍රාහී අපේක්ෂකයා හා ලබාගත් මුළු ඡන්ද සංඛ්‍යාව
මහින්ද රාජපක්ෂ මහතා
එක්සත් ජනතා නිදහස් සන්ධානය
4,887,152 (50.29%)

හයවන ජනාධිපතිවරණය - 2010

ජනාධිපතිවරයා විසින් අභිලාෂය ප්‍රකාශ කිරීම
2009 නොවැම්බර් 23

ජනාධිපතිවරණ පනතේ 2වන වගන්තිය යටතේ ප්‍රකාශය
-

නාමයෝජනා භාර ගැනීමේ දිනය
2009 දෙසැම්බර් 17

ඡන්ද විමසීම පැවති දිනය
2010 ජනවාරි 20

ලියාපදිංචි ඡන්ද සංඛ්‍යාව (2008 නාමලේඛනය අනුව)
14,088,500

තැපැල් ඡන්ද සංඛ්‍යාව
401,118

නාමයෝජනා භාරදුන් අපේක්ෂකයන්
මහින්ද රාජපක්ෂ මහතා - එක්සත් ජනතා නිදහස් සන්ධානය
සරත් ෆොන්සේකා මහතා - නව ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණ
මොහොමඩ් කාසිම් මොහොමඩ් ඉස්මයිල් මහතා - ප්‍රජාතන්ත්‍රවාදී එක්සත් ජාතික පෙරමුණ
අචල අසෝක සුරවීර මහතා - ජාතික සංවර්ධන පෙරමුණ
චන්න ජානක සුගත්සිරි ගමගේ මහතා - එක්සත් ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණ
ඩබ්ලිව්.වී. මහිමන් රංජිත් මහතා - ස්වාධීන
පනාගොඩ දොන් ප්‍රින්ස් සොලමන් අනුර ලියනගේ මහතා - ශ්‍රී ලංකා කම්කරු පක්ෂය
සරත් මනමේන්ද්‍ර මහතා - නව සිහළ උරුමය
එම්.කේ. සිවාජිලිංගම් මහතා - ස්වාධීන
උක්කු බණ්ඩා විජේකෝන් මහතා - ස්වාධීන
ලාල් පෙරේරා මහතා - අපේ ජාතික පෙරමුණ
සිරිතුංග ජයසූරිය මහතා - එක්සත් සමාජවාදී පක්ෂය
වික්‍රමබාහු කරුණාරත්න මහතා - වාමාංශික පෙරමුණ
අයිදුරුස් මොහොමඩ් ඉල්ලයාස් මහතා - ස්වාධීන
විජේ ඩයස් මහතා - සමාජවාදී සමානතා පක්ෂය
සනත් පින්නදූව මහතා - ජාතික සන්ධානය
මොහොමඩ් මුස්තාපා මහතා - ස්වාධීන
බත්තරමුල්ලේ සීලරතන හිමි - ජනසෙත පෙරමුණ
සේනාරත්න ද සිල්වා මහතා - දේශප්‍රේමී ජාතික පෙරමුණ
අරුණ ද සොයිසා මහතා - රුහුණු ජනතා පක්ෂය
උපාලි සරත් කෝන්ගහගේ මහතා - එක්සත් ජාතික විකල්ප පෙරමුණ
මුතුබණ්ඩා තැම්ණිමුල්ල මහතා - ඔක්කොම වැසියෝ ඔක්කොම රජවරු සංවිධානය

ප්‍රකාශිත ඡන්ද සංඛ්‍යාව - 10,501,537 (74.53%)
ප්‍රතික්ෂේපිත ඡන්ද සංඛ්‍යාව - 101,913 (0.97%)
වලංගු ඡන්ද සංඛ්‍යාව - 10,399,624

ජයග්‍රාහී අපේක්ෂකයා හා ලබාගත් මුළු ඡන්ද සංඛ්‍යාව
මහින්ද රාජපක්ෂ මහතා
6,015,934 (50% ඉක්මවා)
එක්සත් ජනතා නිදහස් සන්ධානය

හත්වන ජනාධිපතිවරණය - 2015

ජනාධිපතිවරයා විසින් අභිලාෂය ප්‍රකාශ කිරීම
2014 නොවැම්බර් 20

ජනාධිපතිවරණ පනතේ 2වන වගන්තිය යටතේ ප්‍රකාශය
-

නාමයෝජනා භාර ගැනීමේ දිනය
2014 දෙසැම්බර් 08

ඡන්ද විමසීම පැවති දිනය
2015 ජනවාරි 08

ලියාපදිංචි ඡන්ද සංඛ්‍යාව (2014 නාමලේඛනය අනුව)
15,044,490

තැපැල් ඡන්ද සංඛ්‍යාව
541,452

නාමයෝජනා භාරදුන් අපේක්ෂකයන්

මෛත්‍රීපාල සිරිසේන මහතා - නව ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණ
මහින්ද රාජපක්ෂ මහතා - එක්සත් ජනතා නිදහස් සන්ධානය
ආරච්චිගේ රත්නායක සිරිසේන මහතා - දේශප්‍රේමී ජාතික පෙරමුණ
නාමල් රාජපක්ෂ මහතා - අපේ ජාතික පෙරමුණ
ඉබ්‍රාහිම් මිෆ්ලාර් මහතා - එක්සත් සාම පෙරමුණ
පනාගොඩ දොන් ප්‍රින්ස් සොලමන් අනුර ලියනගේ මහතා - ශ්‍රී ලංකා කම්කරු පක්ෂය
රුවන්තිලක පේදුරුආරච්චි මහතා - එක්සත් ලංකා පොදුජන පක්ෂය
අයිදුරුස් මොහොමඩ් ඉල්ලියාස් මහතා - ස්වාධීන
දුමින්ද නාගමුව මහතා - පෙරටුගාමී සමාජවාදී පක්ෂය
සිරිතුංග ජයසූරිය මහතා - එක්සත් සමාජවාදී පක්ෂය
සරත් මනමේන්ද්‍ර මහතා - නව සිහල උරුමය
පානි විජේසිරිවර්ධන මහතා - සමාජවාදී සමානතා පක්ෂය
අනුරුද්ධ පොල්ගම්පල මහතා - ස්වාධීන
සුන්දරම් මහේන්ද්‍රන් මහතා - නව සමසමාජ පක්ෂය
එම්.බී. තැමිණිමුල්ල මහතා - ඔක්කොම වැසියෝ ඔක්කොම රජවරු සංවිධානය
බත්තරමුල්ලේ සීලරත්න හිමි - ජන සෙත පෙරමුණ
ප්‍රසන්න ප්‍රියංකර මහතා - ප්‍රජාතන්ත්‍රවාදී ජාතික ව්‍යාපාරය
ජයන්ත කුලතුංග මහතා - එක්සත් ලංකා මහා සභා පක්ෂය
විමල් ගීගනගේ මහතා - ශ්‍රී ලංකා ජාතික පෙරමුණ

ප්‍රකාශිත ඡන්ද සංඛ්‍යාව - 12,264,377 (81.52%)
ප්‍රතික්ෂේපිත ඡන්ද සංඛ්‍යාව - 140,925 (1.15%)
වලංගු ඡන්ද සංඛ්‍යාව - 12,123,452

ජයග්‍රාහී අපේක්ෂකයා හා ලබාගත් මුළු ඡන්ද සංඛ්‍යාව
මෛත්‍රීපාල සිරිසේන මහතා
නව ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණ
6,217,162 (51.28%)

අටවන ජනාධිපතිවරණය - 2019

ජනාධිපතිවරණ පනතේ 2වන වගන්තිය යටතේ ප්‍රකාශය
2019 සැප්තැම්බර් 18

නාමයෝජනා භාර ගැනීමේ දිනය
2019 ඔක්තෝම්බර් 07

ඡන්ද විමසීම පැවති දිනය
2019 නොවැම්බර් 16

ලියාපදිංචි ඡන්ද සංඛ්‍යාව (2018 නාමලේඛනය අනුව)
15,992,096

තැපැල් ඡන්ද සංඛ්‍යාව
659,029

නාමයෝජනා භාරදුන් අපේක්ෂකයන්

අපරැක්කේ පුඤ්ඤානන්ද හිමි - ස්වාධීන
එස්.අමරසිංහ මහතා - ස්වාධීන
අයිදුරුස් මොහම්මදු ඉල්ලියාස් මහතා - ස්වාධීන
ඒ.එච්.එම්. අලවි මහතා - ස්වාධීන
ආරියවංශ දිසානායක මහතා - ප්‍රජාතන්ත්‍රවාදී එක්සත් ජාතික පෙරමුණ
පී.එම්. එදිරිසිංහ මහතා - ඔක්කොම වැසියෝ ඔක්කොම රජවරු සංවිධානය
සරත් කීර්තිරත්න මහතා - ස්වාධීන
චන්ද්‍රසේකර හේරත් හිටිහාමි කොරාලලාගේ සමන්සිරි හේරත් මහතා - ස්වාධීන
සිරිතුංග ජයසූරිය මහතා - එක්සත් සමාජවාදී පක්ෂය
අජන්ත ද සොයිසා මහතා - රුහුණු ජනතා පෙරමුණ
අරුණ ද සොයිසා මහතා - ප්‍රජාතන්ත්‍රවාදී ජාතික ව්‍යාපාරය
අනුර කුමාර දිසානායක මහතා - ජාතික ජන බල ව්‍යාපාරය
දුමින්ද නාගමුව මහතා - පෙරටුගාමී සමාජවාදී පක්ෂය
රොහාන් පල්ලෙවත්ත මහතා - ජාතික සංවර්ධන පෙරමුණ
කැටගොඩ ජයන්ත මහතා - ස්වාධීන
සමන් පෙරේරා මහතා - අපේ ජන බල පක්ෂය
අනුරුද්ධ පොල්ගම්පල මහතා - ස්වාධීන
වර්ණකුලසූරිය මිල්රෝයි සර්ජියස් ප්‍රනාන්දු මහතා - ස්වාධීන
සජිත් ප්‍රේමදාස මහතා - නව ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණ
බත්තරමුල්ල සීලරතන හිමි - ජනසෙත පෙරමුණ
බැද්දෙ ගමගේ නන්දිමිත්‍ර මහතා - නව සමසමාජ පක්ෂය
සරත් මනමේන්ද්‍ර මහතා - නව සිහළ උරුමය
එම්.කේ. සිවාජිලිංගම් මහතා - ස්වාධීන
එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා - ස්වාධීන
ගෝඨාභය රාජපක්ෂ මහතා - ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ
නාමල් රාජපක්ෂ මහතා - ජාතික සමගි පෙරමුණ
ඒ.එස්.පී. ලියනගේ මහතා - ශ්‍රී ලංකා කම්කරු පක්ෂය
අශෝක වඩිගමංගාව මහතා - ස්වාධීන
පියසිරි විජේනායක මහතා - ස්වාධීන
අජන්තා පෙරේරා මහත්මිය - ශ්‍රී ලංකාවේ සමාජවාදී පක්ෂය
රාජීව විජේසිංහ මහතා - ස්වාධීන
පානි විජේසිරිවර්ධන මහතා - සමාජවාදී සමානතා පක්ෂය
සමරවීර වීරවන්නි මහතා - ස්වාධීන
සුබ්‍රමනියම් ගුණරත්නම් මහතා - අපේ ජාතික පෙරමුණ
මහේෂ් සේනානායක මහතා - ජාතික ජනතා පක්ෂය

ප්‍රකාශිත ඡන්ද සංඛ්‍යාව - 13,387,951 (83.72%)
ප්‍රතික්ෂේපිත ඡන්ද සංඛ්‍යාව - 135,452 (0.85%)
වලංගු ඡන්ද සංඛ්‍යාව - 13,252,499

ජයග්‍රාහී අපේක්ෂකයා හා ලබාගත් මුළු ඡන්ද සංඛ්‍යාව
ගෝඨාභය රාජපක්ෂ මහතා
ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ
6,924,255 (52.25%)

ආශ්‍රිත ග්‍රන්ථ

1. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව
2. 1981 අංක 15 දරණ ජනාධිපතිවරයා තෝරාපත් කර ගැනීම පිළිබඳ පනත
3. 1982 සිට 2019 දක්වා ජනාධිපතිවරණ වාර්තා හා ලිපිගොනු(මැතිවරණ දෙපාර්තමේන්තුව හා මැතිවරණ කොමිෂන් සභාව)
4. කතිරයේ බලය සඟරාව - 2019 වෙළුම 3 කලාපය 2-3

දේශපාලන ප්‍රජාතන්ත්‍රවාදය

(2වන කොටස)

නලීන් සේමගේ
සම්බන්ධීකරණ ලේකම් - සීමා නිර්ණය කොමිෂන් සභාව

(මෙහි පළමු කොටස 2024 වර්ෂයේ ජනවාරි - අප්‍රේල් කලාපයේ පළ කරන ලදී.)

පෞද්ගලික දේපල හිමිකමට ඇති නිදහස

පුද්ගලයෙකුට සතුට ලබාගැනීමට නම් ඔහු සතුටට පත්වන දේ ලබා ගැනීමේ නිදහස ඔහුට තිබිය යුතුයි. යම් පවුලක මූලික අවශ්‍යතා සපුරාගැනීමට නම්, නිවාස, ඇඳුම් පැලඳුම් සහ ගෘහ භාණ්ඩ ආදිය අවශ්‍ය වේ. එම පවුලේ සාමාජිකයන්ගේ ජීවිතය වඩා පහසු හා ප්‍රසන්න බවට පත් කර ගැනීමට වාහන, රූපවාහිනී යන්ත්‍ර සහ ශීතකරණ යනාදිය ද අවශ්‍ය වේ. පුද්ගලික දේපල හිමිකමට ඇති අයිතිය බොහෝ කලක සිට මිනිසාගේ මූලික නිදහසක් ලෙස සලකනු ලැබේ. තෝමස් ජෙෆර්සන් ගේ කාලය වනතෙක් මිනිසුන් සාමාන්‍යයෙන් කතා කළේ "ජීවිතය" "නිදහස" සහ "දේපළ" පිළිබඳව පමණි. එහෙත් මෙම අදහස පුළුල් කළ ඔහු "ජීවිතය" "නිදහස" සහ " සතුටින් ජීවත් වීම" ලෙස එය වෙනස් කර දැක්වී ය.

ප්‍රජාතන්ත්‍රවාදය යටතේ හුදෙක් නියෝගයක් නිකුත් කිරීමෙන් පමණක් පුද්ගලයෙකුගේ දේපල රජයට අත්පත් කර ගත නොහැකි ය. රජය ඒ සඳහා අධිකරණමය ක්‍රියා පටිපාටිය අනුගමනය කළ යුතු අතර, කිසියම් පියවරක් ගත යුත්තේ පවතින නීතිය යටතේ ය. මෙහි දී පවත්නා නීති ක්‍රියාවලිය යටතේ දේපළ හිමියාට පූර්ණ රැකවරණය ලැබේ. දේපල හිමියා නඩුවෙන් පැරදුනහොත් ඔහුට රජය විසින් සාධාරණ වන්දියක් ගෙවිය යුතු ය.

යථා නීතිමය ක්‍රියාවලියෙන් තොරව ජීවිතය නිදහස හෝ දේපල අහිමි නොවීමට තිබෙන නිදහස

මෙය මානව අයිතිවාසිකම් අතුරින් වඩාත්ම වැදගත් මෙන්ම පුළුල් අයිතිවාසිකම වන්නේ ය. ඒකාධිපතියෙකුගෙන් හෝ අසාධාරණ බහුතරයකගෙන් කිසියම් පුද්ගලයෙකුට සිදුවන තර්ජනයක් නිසා ඔහුට හෝ ඇයට කිසිදු වග විභාගයකින් තොරව සිරගත වීමට සිදු වේ යයි බියක් හට ගනී. කිසියම් තර්ජනයකට භාජනය වූ පුද්ගලයෙකු සුලු හෝ අසාමාන්‍ය සිද්ධියකින් වුව ද බියට පත්වීම පොදු ලක්ෂණයකි. රජය කෝපයට පත් කළ පුද්ගලයින්ට ඇතිවන තවත් බියක් වනුයේ ඔවුන්ගේ පුද්ගලික දේපල විනාශ කරයි යන්නයි. ඒකාධිපති වාදය යටතේ බොහෝ විට වෘත්තීය සමිති නායකයින්, සමාජ ක්‍රියාකාරිකයින් විරුද්ධ දේශපාලනඥයන් හිතුවක්කාර ලෙස අත් අඩංගුවට ගෙන ඔවුන්ගේ සංවිධාන තහනම් කරනු ලබයි. ශත වර්ෂ ගණනාවක් තිස්සේ මිනිසාගේ ජීවිතය, නිදහස සහ දේපල රැකදෙන නීති පටිපාටි ලැයිස්තුවක් සකස් වී තිබේ. මෙම නීති පටිපාටි "යථා නීතිමය ක්‍රියාවලිය" වශයෙන් හැඳින්වේ.

යථා නීතිමය ක්‍රියාවලිය

යථා නීතිමය ක්‍රියාවලියේ අත්‍යවශ්‍ය අංග කීපයක් පිළිබඳ කෙටි හැඳින්වීමක් පහත දැක්වේ.

- ඇතැම් පුද්ගලයින්ට පමණක් දඬුවම් කරන නීති නොමැත. අතීතයට බලපාන පරිදි නීති පැනවිය නොහැක. එලෙස නීති පැනවීම ප්‍රජාතන්ත්‍රවාදී රටවල් තහනම් කර ඇත.
- බොහෝමයක් ප්‍රජාතන්ත්‍රවාදී රටවල පුද්ගලයෙකුගේ නිවසක් හෝ යම් සංවිධානයක කාර්යාලයක් සෝදිසි කළහැක්කේ විනිශ්චයකරුවෙකු විසින් ඒ සඳහා පොලිසියට අවසරයක් නිකුත් කර ඇත්නම් පමණි.
- ප්‍රජාතන්ත්‍රවාදී රටක, අත් අඩංගුවට ගත්, පුද්ගලයෙක් බන්ධනාගාරයේ සිටීමට හේතුවක් නැතැයි තමන් සිතන්නේ නම් විනිශ්චයකරුවෙකුට පරීක්ෂණයක් පවත්වන මෙන් එම පුද්ගලයාට ඉල්ලා සිටිය හැකි ය.
- පුද්ගලයෙකු අත්අඩංගුවට ගෙන, බන්ධනාගාරගත කර නීතිය යටතේ වරදකට නඩු පවරා ඇත්නම් එහිදී එම පුද්ගලයා නිර්දෝෂී නම් තම නිර්දෝෂීභාවය කියාපෑම සඳහා අවස්ථාවක් ඔහුට හෝ ඇයට තිබිය යුතු ය. එම පුද්ගලයා වැරදිකරු නම් ඊට අදාළ සියළු විස්තර පැවසීමටත්, එමගින් හැකි තරම් ලිහිල් තීන්දුවක් ලබා ගැනීමටත් ඔහුට අවශ්‍ය වේ නම් " යථා නීතිමය ක්‍රියාවලිය" යටතේ " අපක්ෂපාතී අධිකරණයක් " මගින් "සාධාරණ හා විවෘත නඩු විභාගයක්" ලබා ගැනීම මේ අනුව වැදගත් වේ.
- සෑම විනිශ්චයකරුවෙක්ම දේශපාලනික වශයෙන් අපක්ෂපාතී විය යුතු ය. නඩු සම්බන්ධයෙන් ඔවුන් තීරණ ගත යුත්තේ අනිවාර්යයෙන්ම නීතිය සහ අදාළ තොරතුරු ආශ්‍රයෙන් පමණි.
- ප්‍රජාතන්ත්‍රවාදී රටවල වරදක් කළා යැයි චෝදනා ලබන පුද්ගලයෙකු, වැරදිකරුවෙක් බවට බවට ඔප්පු කරන තෙක් නිර්දෝෂී ලෙස සලකනු ලැබේ. එම පුද්ගලයා වැරදිකරු බවට සනාථවීමට කලින් ඔහුට කිසිදු දඩුවමක් දීමට හෝ අයහපත් ලෙස සැලකීම කළ නොහැක. ප්‍රජාතන්ත්‍රවාදී රටවල වැරදිකරු බව ඔප්පු කිරීම රජය විසින් කළ යුතු අතර චූදිතයින් විසින් එය කළ යුතු යයි අපේක්ෂා නොකෙරේ.
- වරක් නිර්දෝෂී බවට තීන්දු කරන කරන ලද පුද්ගලයෙකුට, එකම චෝදනා යටතේ දෙවන වරටත් නඩු විභාගයක් පැවැත්වීමෙන් පුද්ගලයාගේ නිදහස අවදානමට පත් නොකළ යුතු ය.
- සෑම ප්‍රජාතන්ත්‍රවාදී රටකම "යථා නීතිමය ක්‍රියාවලිය" මගින් පුද්ගලයෙකුගෙන් පාපොච්චාරණයක් ලබා ගැනීමේ අරමුණු ඇතිව ඔහුට වධහිංසා පැමිණවීම තහනම් කර තිබේ. වැරදිකරුවෙකුට පවා වධහිංසා පැමිණ වීම කෲර ක්‍රියාවකි.

දේශපාලන බලය බෙදීම "දේශපාලන බහුත්ව වාදය"

ප්‍රජාතන්ත්‍රවාදයට අවශ්‍ය වන්නේ මහජනතාවගේ වැඩි දියුණුවත් ඒ සඳහා පුද්ගලයා තමන් විසින්ම පාලනය කළ යුතු බවත් ඉහත දී සාකච්ඡා කර ඇත. තමන් විසින් තමන් පාලනය කර ගැනීම සඳහා බහුතර පාලනය,

නියෝජිතවරු, සහ මැතිවරණ යන දෑ පුද්ගලයෙකු විසින් ප්‍රයෝජනට ගත යුතු ය. ඒකාධිපති පාලකයන්ගෙන් හෝ අසාධාරණ බහුතරයක දුෂ්ඨ පාලනයෙන් ආරක්ෂාවීමට නම්, ජනතාවගේ ස්භාවික අයිතිවාසිකම් උල්ලංඝණය නොකළ යුතු වේ. ජනතාව, ඔවුනොවුන් විසින්ම පාලනය කරන්නේ නම් දේශපාලන බලය පුළුල් වශයෙන් ඔවුන් අතර බෙදිය යුතු ය. නායකයින් කිහිප දෙනෙක් අතර පමණක් සම්පූර්ණ බලය රැඳීමට ඉඩ නොතැබිය යුතු ය. ස්වභාවික අයිතිවාසිකම් රැක ගැනීමට නම් බලයද පුළුල් ලෙස බෙදා හැරිය යුතුයි. ඒ අනුව දේශපාලන බලය බෙදී යාම මහජනතාව විසින් පාලනය කිරීමත් ඔවුන්ගේ ස්වාභාවික අයිතිවාසිකම් ආරක්ෂා කිරීමටත් යන දෙක සඳහාම අවශ්‍ය වේ. ධනවත් සහ දුගී යන දෙකොටසම අයත් කණ්ඩායම්, පුද්ගලයින්, "ජන සංවිධාන" විශාල සංඛ්‍යාවකට දේශපාලන බලය හිමිය. දේශපාලන බලය විමධ්‍යගත කිරීම, දේශපාලන බහුත්ව වාදය නමින් හැඳින්වේ. දේශපාලන බහුත්ව වාදය සහ ආර්ථික බහුත්ව වාදය යන දෙකම තිබෙන රටවල් " බහුත්වවාදී සමාජ" නමින් හැඳින්වේ.

ප්‍රජාතන්ත්‍රවාදී රටක දේශපාලන පක්ෂ එකකට වැඩි ගණනක් තිබිය යුතු ය. ඒ අනුව බලයේ සිටින පක්ෂය හා ප්‍රතිවිරුද්ධ පක්ෂ අතර බලය බෙදී යයි. එමෙන්ම පුද්ගල කණ්ඩායම්, ආයතන, වෘත්තීය සමිති, වෙළඳ සංගම්, ශිෂ්‍ය සංගම්, ආගමික සංවිධාන, ක්‍රීඩා සමාජ, සමුපකාර, කාන්තා සහ ළමා සමාජ, සංස්කෘතික කණ්ඩායම් සහ වෙනත් ප්‍රජා සංවිධාන යනාදිය ද රටක තිබිය යුතු ය. සෑම කණ්ඩායමකට හෝ ආයතනයකට යම් යම් අවශ්‍යතාවයන් මෙන්ම විශේෂත්වයක් දක්වන ලබාගත යුතු හා ආරක්ෂා කළ යුතු අංගයක්ද තිබේ. මේවා ලබා ගැනීම සඳහා විවිධ උපක්‍රම භාවිතා කරයි. එනම් ඡන්දය, සාමුහික කේවල් කිරීම, ප්‍රසිද්ධ විරෝධතා ව්‍යාපාර, වැඩ වර්ජන, සාකච්ඡා, සහ මාධ්‍ය නිවේදන ආදිය වේ. මෙයින් අදහස් වන්නේ මහජනතාවට බලය තිබෙන බවකි.

පුද්ගල කණ්ඩායම් හා ආයතන ගණනාවක් අතර බලය බෙදා හැරිය යුතු අතර රජයේ බලය ද විමධ්‍යගත කිරීම කළ යුතු ය. ජාතික පාර්ලිමේන්තුවක් හෝ එහි නියෝජිතයින් තේරීමට කලින් කලට පැවැත්වෙන ජාතික මැතිවරණ පමණක් බහුත්වවාදී ප්‍රජාතන්ත්‍රවාදයක් ඇති කිරීමට ප්‍රමාණවත් නොවේ. ඒ බල ප්‍රදේශවලින් තෝරා පත් කරගත් පළාත් හා ප්‍රාදේශීය ආණ්ඩු ආදිය ශක්තිමත් ප්‍රජාතන්ත්‍රවාදයක් තිබෙන රටවල දක්නට ලැබේ.

දේශපාලන බහුත්වවාදය ඒකාධිපතිත්වය බිහිවීම වළක්වන බව පැහැදිලි වේ. බලය මහජනතාව අතර බෙදී යන විට පමණක් ඔවුන්ගේ නායකයින් මගින් නොව ඔවුන් විසින්ම පාලනය කරන බැව් තහවුරු කර ගනිති. සුළුතර ජනතාවට සිය අයිතිවාසිකම් සුරක්ෂිත බැව් හැඟෙන්නේ එම අවස්ථාවට පත් වු විට පමණි. බලය පුළුල් ලෙස බෙදී ගොස් ඇති විටක දී කිසිදු කණ්ඩායමකට තවත් කණ්ඩායමක් පාලනය කිරීමේ හැකියාව හෝ ජනතාවගේ ස්වභාවික අයිතිවාසිකම් උල්ලංඝණය කළ හැකි පරිදි බලයක් ලැබෙන්නේ නැති බව සුළුතර කණ්ඩායම් අවබෝධ කර ගනී.

2024 - 2023 ඡන්ද හිමි නාමලේඛනයට

අනුව එක් එක් මැතිවරණ කොට්ඨාසයේ ලියාපදිංචි ඡන්ද හිමියන් සංඛ්‍යාව

මැතිවරණ කොට්ඨාසයේ අංකය හා නම		ඡන්ද හිමියන් සංඛ්‍යාව	
		2023	2024
01	කොළඹ	1,751,706	1,765,351
02	ගම්පහ	1,866,494	1,881,129
03	කළුතර	1,015,842	1,024,244
04	මහනුවර	1,190,301	1,191,399
05	මාතලේ	428,800	429,991
06	නුවරඑළිය	601,596	605,292
07	ගාල්ල	902,574	903,163
08	මාතර	684,807	686,175
09	හම්බන්තොට	520,370	520,940
10	යාපනය	594,096	593,187
	යාපනය දිස්ත්‍රික්කය	493,443	492,280
	කිළිනොච්චි දිස්ත්‍රික්කය	100,653	100,907
11	වන්නි	304,700	306,081
	වවුනියාව දිස්ත්‍රික්කය	127,537	128,585
	මන්නාරම දිස්ත්‍රික්කය	90,745	90,607
	මුලතිව් දිස්ත්‍රික්කය	86,418	86,889
12	මඩකලපුව	446,999	449,686
13	දිගාමඩුල්ල	551,703	555,432
14	ත්‍රිකුණාමලය	312,082	315,925
15	කුරුණෑගල	1,413,666	1,417,226
16	පුත්තලම	658,939	663,673
17	අනුරාධපුරය	739,274	741,862
18	පොළොන්නරුව	350,498	351,302
19	බදුල්ල	702,372	705,772
20	මොණරාගල	397,407	399,166
21	රත්නපුර	921,334	923,736
22	කෑගල්ල	707,783	709,622
	එකතුව	17,063,343	17,140,354

2023 අංක 03 දරන මැතිවරණ වියදම් නියාමනය කිරීමේ පනත

නීතිඥ චින්තක කුලරත්න
අතිරේක මැතිවරණ කොමසාරිස් - (නීති හා විමර්ශන)

පනතේ අරමුණු

- මැතිවරණයක්/ ඡන්ද විමසීමක් සඳහා ඉදිරිපත් වන සෑම අපේක්ෂකයකුටම තරග කිරීමට සමබිමක් නිර්මාණය කිරීම.
- අපේක්ෂකයන් වෙත ලැබෙන පරිත්‍යාග, දායකත්ව හා ඒවායේ මූලාශ්‍රයන්හි විනිවිදභාවයක් ඇති කිරීම.
- රාජ්‍ය දේපළ අවභාවිතාව වැළැක්වීම.
- විදේශ රාජ්‍ය හා සංවිධාන රටේ පාලනයට මැදිහත්වීම වැළැක්වීම.
- මැතිවරණ වියදම් පාලනයක් මෙන්ම එහි විනිවිදභාවයක් ඇති කිරීම.
- ජනතාවට බලපෑමකින් තොරව ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතිය සුරක්ෂිත කිරීම.
- මැතිවරණ වියදම් නියාමනයට නෛතික පදනමක් ලබාදීම.

පනත අදාළ වන මැතිවරණ

- පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනත (262වන අධිකාරය);
- 1988 අංක 02 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනත;
- 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනත;
- 1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ පනත; වේ.

ගණනය කිරීමේ කාර්යය සඳහා මුදලක් තීරණය කිරීම.

අවසරලත් මුදල තීරණය කිරීම සඳහා ගණනය කිරීමේ කාර්යයට භාවිතයට ගැනීම සඳහා ශ්‍රී ලංකා රුපියල්වලින් යම් මුදලක් පහත කරුණු සලකා බලා තීරණය කළ යුතු ය.

- අදාළ වන පරිදි මැතිවරණයට තරග කරන ලද දේශපාලන පක්ෂ හා ස්වාධීන කණ්ඩායම් විමසා;
- ජනාධිපතිවරණයක දී නම් තරග කරන සියළුම අපේක්ෂකයන් විමසා;
- ශ්‍රී ලංකාවේ පවත්නා උද්ධමන අනුපාතය හා පාරිභෝගික මිල දර්ශකය සැලකිල්ලට ගෙන; අවසරලත් මුදල තීරණය කරනු ලැබේ.

මැතිවරණ කොමිෂන් සභාව විසින් නාමයෝජනා භාරදීමේ කාලසීමාව අවසන් වී දින පහක කාලයක් ඇතුළත අවසරලත් මුදල තීරණය කොට ගැසට් පත්‍රයේ පළ කළ යුතු ය.

(පසුගිය පළාත් පාලන මැතිවරණයේ දී ගණනය කිරීමේ කාර්යය සඳහා තීරණය කරන ලද මුදල රුපියල් විස්සකි).

අවසරලත් මුදල මැතිවරණ සඳහා තීරණය කරන ආකාරය

1. පළාත් පාලන ආයතන ඡන්ද විමසීම ආඥා පනත (262 අධිකාරය)

1.1. කොට්ඨාසයෙන් තරග කරන අපේක්ෂකයකු සම්බන්ධයෙන් ගණනය කිරීම

තරග කරන පළාත් පාලන ඡන්ද විමසීමට අයත් පළාත් පාලන බලප්‍රදේශයේ ඡන්ද කොට්ඨාසවල ලියාපදිංචි මුළු ඡන්ද දායකයන් සංඛ්‍යාව තීරණය කරන ලද මුදලින් ගුණ කිරීමෙන්,

නිදසුන් : කොළඹ මහ නගර සභාව

කොට්ඨාශය	ලියාපදිංචි ඡන්දදායකයින් සංඛ්‍යාව	තීරණය කරන ලද මුදල (රු.)	අපේක්ෂකයකුට වැය කල හැකි උපරිම වියදම් සීමාව (රු.)
1.සම්මන්ත්‍රණපුර	5,054	20.00	101,080.00
2.මට්ටක්කුලිය	20,084	20.00	401,680.00
3.මෝදර	22,341	20.00	446,820.00
4.මහවත්ත	11,234	20.00	224,680.00

1.2. අතිරේක ලැයිස්තුවෙන් තරග කරන අපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ගණනය කිරීම.

තරග කරන පළාත් පාලන ඡන්ද විමසීමට අයත් පළාත් පාලන බලප්‍රදේශයේ ඡන්ද කොට්ඨාසවල ලියාපදිංචි මුළු ඡන්ද දායකයන් සංඛ්‍යාව තීරණය කරන ලද මුදලින් ගුණ කිරීමෙන් ලැබෙන අගයේ ප්‍රතිශතයක් (40%) අතිරේක ලැයිස්තුවේ අපේක්ෂකයන් සඳහා තීරණය වේ.

නිදසුන් :

කොළඹ මහනගර සභාව සමස්ත ඡන්දදායකයන් ගණන = 392,634

$$392,634 \times රු.20.00 \times \frac{40}{100} = රු.3,141,072.00$$

කොළඹ මහනගර සභාවේ අතිරේක ලැයිස්තුවේ මන්ත්‍රීන් ගණන = 44

$$\frac{රු.3,141,072.00}{44} = රු.71,388.00$$

(අතිරේක ලැයිස්තුවේ අපේක්ෂකයෙකුට වැය කළ හැකි උපරිම වියදම් සීමාව)

1.3. දේශපාලන පක්ෂයක් සම්බන්ධයෙන් අවසරලත් මුදල ගණනය කිරීම.

තරග කරන පළාත් පාලන ඡන්ද විමසීමට අයත් පළාත් පාලන බලප්‍රදේශයේ ඡන්ද කොට්ඨාසවල ලියාපදිංචි මුළු ඡන්ද දායකයන් සංඛ්‍යාව තීරණය කරන ලද මුදලින් ගුණ කිරීමෙන් ලැබෙන අගයේ යම් ප්‍රතිශතයක් (60%)නියම කිරීම.

නිදසුන් :

කොළඹ මහනගර සභාව සමස්ත ඡන්දදායකයන් ගණන = 392,634

$$392,634 \times රු.20.00 \times \frac{60}{100} = රු.4,711,638.00$$

(කොළඹ මහනගර සභාවට තරග කරන දේශපාලන පක්ෂයකට වැය කළ හැකි උපරිම වියදම් සීමාව)

2. 1988 අංක 02 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනත

2.1. පරිපාලන දිස්ත්‍රික්කය නියෝජනය කරන ලද එක් අපේක්ෂකයෙකු සම්බන්ධයෙන් උපරිම මුදල ගණනය කිරීම

දිස්ත්‍රික්කය	ලියාපදිංචි කරන ලද ඡන්දදායකයින් සංඛ්‍යාව	ගණනය කරන ලද මුදල (රු)	අපේක්ෂකයකුට වැය කල හැකි උපරිම වියදම් සීමාව (රු.)
කොළඹ	1,765,351	109.00	192,423,955.40

2.2. දේශපාලන පක්ෂයක් සම්බන්ධයෙන් උපරිම මුදල ගණනය කිරීම

දිස්ත්‍රික්කය	ලියාපදිංචි කරන ලද ඡන්දදායකයින් සංඛ්‍යාව	ගණනය කරන ලද මුදල (රු.)	පක්ෂයකට වැය කල හැකි උපරිම වියදම් සීමාව (රු.)
කොළඹ	1,765,351	109.00 x 60/100	115,435,955,50

3. 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනත

3.1. මැතිවරණ කොට්ඨාසය නියෝජනය කරන එක් අපේක්ෂකයෙක් සම්බන්ධයෙන් උපරිම මුදල ගණනය කිරීම

දිස්ත්‍රික්කය	ලියාපදිංචි කරන ලද ඡන්දදායකයින් සංඛ්‍යාව	ගණනය කරන ලද මුදල (රු)	අපේක්ෂකයකුට වැය කල හැකි උපරිම වියදම් සීමාව (රු.)
කොළඹ	1,765,351	109.00	192,423,259.00

3.2. ජාතික ලැයිස්තුව නියෝජනය කරන එක් අපේක්ෂකයෙක් සම්බන්ධයෙන් උපරිම මුදල ගණනය කිරීම.

පාර්ලිමේන්තු මැතිවරණ පනතේ ජාතික ලැයිස්තුවෙන් ඉදිරිපත් කරන අපේක්ෂකයන්ට එක් එක් පරිපාලන දිස්ත්‍රික්ක සඳහා තීරණය කරන ලද මුදලින් ගුණ කිරීමෙන් ලැබෙන අගයේ යම් ප්‍රතිශතයක් මැතිවරණ කොමිෂන් සභාව විසින් තීරණය කිරීම.

3.3. දේශපාලන පක්ෂයක් සම්බන්ධයෙන් උපරිම මුදල ගණනය කිරීම

දිස්ත්‍රික්කය	ලියාපදිංචි කරන ලද ඡන්දදායකයින් සංඛ්‍යාව	ගණනය කරන ලද මුදල (රු.)	පක්ෂයකට වැය කල හැකි උපරිම වියදම් සීමාව (රු.)
කොළඹ	1,765,351	109.00 x 60/100	115,453,955.40

04. 1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ පනත

4.1. අපේක්ෂකයෙක් සම්බන්ධයෙන් උපරිම මුදල ගණනය කිරීම

දිවයිනේ එක් එක් ඡන්ද කොට්ඨාසවල ලියාපදිංචි ඡන්දදායකයින් සංඛ්‍යාව	ගණනය කරන ලද මුදල (රු)	අපේක්ෂකයකුට වැය කල හැකි උපරිම වියදම් සීමාව (රු.)
17,140,354	109.00 x 60/100	1,120,979,151.60

4.2. දේශපාලන පක්ෂයක් සම්බන්ධයෙන් උපරිම මුදල ගණනය කිරීම

දිවයිනේ එක් එක් ඡන්ද කොට්ඨාසවල ලියාපදිංචි ඡන්දදායකයින් සංඛ්‍යාව	ගණනය කරන ලද මුදල (රු)	අපේක්ෂකයකුට වැය කල හැකි උපරිම වියදම් සීමාව (රු.)
17,140,354	109.00 x 40/100	747,319,434.40

භාරගනු ලැබූ පරිත්‍යාග හෝ දායකත්වය සහ දරන ලද වියදම්වල වාර්තා භාරදිය යුතු බව

- පනතේ 2 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති එක් එක් මැතිවරණ සඳහා තරඟ කරන ලද පක්ෂ, කණ්ඩායම් හා අපේක්ෂකයා විසින්, ප්‍රතිඵල ප්‍රකාශ කොට දින 21 ඇතුළත, අදාළ බලධරයා වෙත, එනම්, වාර්තාව පහත දක්වා ඇති නිශ්චිත බලධරයා වෙත ලබාදිය යුතු ය.
    - පළාත් පාලන ඡන්ද විමසීමක දී මැතිවරණ කොමිෂන් සභාවට පිටපතක් සහිතව අදාළ පළාත් පාලන ආයතන බල ප්‍රදේශයේ තේරීම්භාර නිලධාරියාට;
    - පළාත් සභා ඡන්ද විමසීමක දී මැතිවරණ කොමිෂන් සභාවට පිටපතක් සහිතව පරිපාලන දිස්ත්‍රික්කයේ තේරීම්භාර නිලධාරියාට;
    - පාර්ලිමේන්තු මැතිවරණයක දී මැතිවරණ කොමිෂන් සභාවට පිටපතක් සහිතව අදාළ මැතිවරණ කොට්ඨාසයේ තේරීම්භාර නිලධාරියාට;
    - ජනාධිපතිවරයා තෝරාපත් කර ගැනීමේ ඡන්දයක දී මැතිවරණ කොමිෂන් සභාවට;
- පිළිගත් පක්ෂයක්, ස්වාධීන කණ්ඩායම හෝ අපේක්ෂකයා විසින් හෝ වෙනුවෙන් පිළිගත් හෝ භාරගත් සියලු පරිත්‍යාග හෝ දායකත්ව පිළිබඳ වාර්තාවක්;
- පිළිගත් පක්ෂයක්, ස්වාධීන කණ්ඩායමක් හෝ අපේක්ෂකයා විසින් හෝ වෙනුවෙන් දරන ලද සියලු වියදම් පිළිබඳ වාර්තාවක්; භාරදෙනු ලැබිය යුතු ය.

ප්‍රතිඵල ප්‍රකාශයට පත් කරනු ලබන දිනය

- පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනතේ 66 වගන්තිය යටතේ;
- 1988 අංක 02 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනතේ 60 වන වගන්තිය යටතේ;
- 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 62 වන වගන්තිය යටතේ;සහ
- 1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ පනතේ 64 (2) වගන්තිය යටතේ;

ප්‍රතිඵල ප්‍රකාශයට පත්කරනු ලබන දිනය යන්න අදහස් වේ.

පරිත්‍යාග හා දායකත්ව වාර්තාව

- පරිත්‍යාග හා දායකත්ව පිළිබඳ වූ වාර්තාවේ පිළිගත් දේශපාලන පක්ෂය, කණ්ඩායම හෝ අපේක්ෂකයා විසින් හෝ වෙනුවෙන් පිළිගනු ලැබූ හෝ භාර ගනු ලැබූ සියළු පරිත්‍යාග හෝ දායකත්වයන් සහ ඒවා ද්‍රව්‍යමය ලෙස ලැබුණේ නම් ඒවායේ ඇස්තමේන්තු වටිනාකම;
- පරිත්‍යාග හෝ දායකත්ව භාරගනු ලැබුවේ ත්‍යාග, ණය මුදල්, අත්තිකාරම් හෝ තැන්පතු වශයෙන් ද යන වග;
- පරිත්‍යාග හෝ දායකත්වය සිදුකරන ලද තනි පුද්ගලයන් හෝ සංස්ථාගත කළ හෝ නොකළ පුද්ගල මණ්ඩලවල නම, ලිපිනය සහ ජාතික හැඳුනුම්පත් අංකය හෝ ලියාපදිංචි අංකය; සඳහන් කළ යුතු ය.

වියදම් වාර්තාව

සියළු වියදම් ඇතුළත් වාර්තාවේ;

- ප්‍රචාරක දැන්වීම්, අත් පත්‍රිකා, ධජ, සිතුවම්, ඡායාරූප, දැන්වීම් පත්‍ර හෝ පෝස්ටර් මුද්‍රණය කිරීම, ප්‍රකාශයට පත් කිරීම, ඇලවීම, ප්‍රදර්ශනය කිරීම හෝ නිරූපණය;
- ප්‍රචාරක දැන්වීම් නිෂ්පාදනය කිරීම හා , ගුවන් විදුලියේ හෝ රූපවාහිනියේ ප්‍රචාරය කිරීම;
- ප්‍රචාරක දැන්වීම් නිෂ්පාදනය කර, පුවත්පත්, වාර සඟරා, සමාජ මාධ්‍ය, ඩිජිටල් ප්‍රචාරණය හෝ වෙනත් ප්‍රචාරණවල ප්‍රකාශයට පත් කිරීම;
- රැස්වීම් පැවැත්වීමට හා උපකරණ කුලියට ගැනීමට යන වියදම්;
- අපේක්ෂකයාට හැර වෙනත් ප්‍රවාහන වියදම්;
- ඉහත සේවාවන්ට ගෙවා ඇත්නම් තහවුරු කිරීමට බිල්පත්, කුවිතාන්සි සහිතව දරන ලද වියදම් ඇතුළත් කළ යුතු ය.

පිළිගැනීම තහනම් පරිත්‍යාග

- රජයේ කුමන හෝ ආයතනයක් විසින්; (දෙපාර්තමේන්තු/ සංස්ථා/ සමාගම්)
- විදේශීය රාජ්‍යයකින් හෝ ජාත්‍යන්තර සංවිධානයක් විසින්;
- සෘජුව හෝ වක්‍රව විදේශීය කොටස් හිමිකාරිත්වය 50% ක්වත් දරන සමාගමක් විසින්; (ශ්‍රී ලංකාවේ සංස්ථාගත කරන සමාගමක් විසින්)
- අනන්‍යතාව හෙළි නොකරන යම් තැනැත්තන් විසින්;
- පිළිගත් දේශපාලන පක්ෂයක්, ස්වාධීන කණ්ඩායමක් හෝ අපේක්ෂකයකුගේ මැතිවරණ ප්‍රවර්ධනයට ලබාදෙන පරිත්‍යාග හෝ දායකත්ව පිළිගැනීම තහනම් බව.
- මෙම වගන්තිය උල්ලංඝනය කිරීම නීති විරෝධී ක්‍රියාවක් වන වරදක් සිදුකරනු ලබන බව හා ඒ නීතිය යටතේ පනවනු ලැබ ඇති දණ්ඩණයකට යටත් වන බව.
- වාර්තාවට ඇතුළත් නොකළ යුතු වියදම්
- මැතිවරණ ප්‍රදේශය තුළ අපේක්ෂකයාගේ ප්‍රවාහන කටයුතුවලට දරන ලද වියදම්.
- ලිපි ද්‍රව්‍ය, දුරකථන හෝ වෙනත් ආකාරයේ සන්නිවේදන කටයුතුවලට දරන ලද වියදම්.
- කිසිදු අවස්ථාවක එක් එක් මැතිවරණ පනතේ සඳහන් වැරදි, දූෂණ ක්‍රියා හා නීති විරෝධී ක්‍රියා උල්ලංඝනය නොවන වියදම් විය යුතු ය.

වාර්තා සම්බන්ධ ප්‍රකාශය

- ඉදිරිපත් කළ තොරතුරු තම දැනීමේ හැටියට සත්‍ය සහ නිවැරදි බවට පිළිගෙන ඒ ඒ අවස්ථාවෝචිත පරිදි දේශපාලන පක්ෂ ලේකම්වරයා, ස්වාධීන කණ්ඩායම් නායකයා හෝ අපේක්ෂකයා විසින් අත්සන් කළ යුතු ය.
- සාමදාන විනිශ්චයකාරවරයකු විසින් එය සහතික කළ යුතු ය.

වාර්තා ප්‍රසිද්ධ කිරීම

- පළාත් පාලන ආයතන ඡන්ද විමසීමේ ආඥාපනත යටතේ හෝ 1988 අංක 02 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනත යටතේ හෝ 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනත යටතේ පවත්වනු ලබන මැතිවරණයක් සම්බන්ධ වන විට අදාළ තේරීම්භාර නිලධරයා විසින් හා ජනාධිපතිවරයා තේරීමේ ඡන්ද විමසීමේ දී මැතිවරන කොමිෂන් සභාව විසින්;
- එම වාර්තා සහ ප්‍රකාශ යම් තැනැත්තෙකුට පරීක්ෂා කර බැලිය හැකි ස්ථානය සහ වේලාවන් දක්වමින් අවස්ථාවෝචිත පරිදි තේරීම්භාර නිලධරයා විසින් හෝ මැතිවරණ කොමිෂන් සභාව විසින්;
- 6 (1) උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති කාල සීමාව ඉකුත් වීමෙන් පසුව දින දහයක් (10) ඇතුළත 7(1) වගන්තිය අනුව ආදායම් වියදම් වාර්තා පරීක්ෂා කර බැලීම සඳහා වාර්තා තබා ඇති බව ප්‍රසිද්ධ කිරීමේ දැන්වීම පළ කරනු ලැබිය යුතු ය.
- සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලින් අවම වශයෙන් එක් ජාතික පුවත්පතකවත් දැන්වීමක් පළ කළ යුතු ය.

වාර්තා පරීක්ෂා කිරීම

- දැනුම්දුන් ස්ථානයේ දී හා වේලාවේ දී අදාළ වාර්තා පරීක්ෂා කර බැලීමට තේරීම්භාර නිලධාරියා විසින් පුරවැසියාට ඉඩ ලබාදිය යුතු ය.
- මැතිවරණ කොමිෂන් සභාව තීරණය කරනු ලබන නියමිත ගාස්තුවක් ගෙවා එම වාර්තාවල හෝ ප්‍රකාශනවල පිටපත් ලබා ගැනීමේ හැකියාව පවතී.

නීති විරෝධී ක්‍රියා පිළිබඳ වාර්තා

- දෙවන (2) වගන්තිය යටතේ නිශ්චය කර ඇති මැතිවරණයක දී,
- සාධාරණ හේතුවක් නොමැතිව භාර ගනු ලැබූ සියළු පරිත්‍යාග හෝ දායකත්වයන් පිළිබඳව හා දරන ලද සියලු වියදම් පිළිබඳ වාර්තාවන් 6(3) වගන්තියේ දක්වා ඇති බලධරයන්ට දින 21ක් ඇතුළත භාර දීමට අපොහොසත් වන;
- එකී වාර්තා 6 (6) උපවගන්තියේ ප්‍රකාශනය හා සාවද්‍ය බව ඒ තැනැත්තා විසින් දැනුවත්ව හෝ සාධාරණව දැන සිටිනු ලැබිය හැකි ප්‍රකාශයක් වන්නා වූ යම් ප්‍රකාශයක් සිදුකරන;
- යම් මැතිවරණයක දී අවසරලත් මුදල ඉක්මවා වියදම් දැරීම නීති විරෝධී ක්‍රියාවක් වන වරදක් සිදුකරනු ලබන බව;
- නීති විරෝධී ක්‍රියාවක් සිදු කිරීම සම්බන්ධයෙන් ඒ නීතිය මගින් නියමිතව දක්වා ඇති දණ්ඩනයකට යටත් විය යුතු ය.
- සෑම අපේක්ෂකයකුම නිශ්චිතව දක්වා ඇති නීතියක අර්ථානුකූලව නීති විරෝධී ක්‍රියාවක් වන වරදක් සිදුකරනු ලබන අතර, එම දණ්ඩනයට යටත් විය යුතු ය.
- අපේක්ෂකයා විසින් සිය අනුදැනුමක් හෝ අනුබලයක් නොමැතිව අදාළ වියදම් සිදුකළ බව ඔප්පු කර නැත්නම් නීති විරෝධී ක්‍රියාවක් වන වරදක් සම්බන්ධයෙන් නීතියේ දණ්ඩනයකට යටත් වන බව.

නීති විරෝධී ක්‍රියා සම්බන්ධයෙන් වූ වරදකට දඬුවම්

ඉහත සඳහන් වගන්ති යටතේ දෙවන (2) වගන්තියේ දක්වා ඇති නීතියක් යටතේ නීති විරෝධී ක්‍රියාවක් සිදුකළ සෑම පිළිගත් දේශපාලන පක්ෂ, ස්වාධීන කණ්ඩායමක් හා අපේක්ෂකයකු මහාධිකරණයක් මඟින් වරදකරු වූ විට ඒ ඒ පනත්වල නියම කර ඇති දණ්ඩනයකට යටත් විය යුතු ය.

- රු. 100,000.00 නොඉක්මවන දඩයක්.
- වරදකරු වීම හේතුවෙන් වසර 03ක කාලයකට ඡන්ද හිමියකු ලෙස ලියාපදිංචි වීමට හෝ ඡන්දය දීමට හෝ මන්ත්‍රීවරයකු ලෙස තෝරා පත්කර ගැනීමට අශක්‍යතාවට පත්විය යුතු ය.
- පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු ලෙස තෝරාපත්කර ගෙන සිටියේ නම් එම වරද කරනු ලැබූ දිනයේ එම තනතුර නිශ්ප්‍රභ වේ.
- මේ සඳහා නඩු පැවරීම් නීතිපතිවරයා විමසා සිදුකළ යුතු ය.

පැමිණිලි කිරීම

යම් පිළිගත් දේශපාලන පක්ෂ, ස්වාධීන කණ්ඩායම් හෝ අපේක්ෂකයකු ලබා දී ඇති වාර්තා හා ප්‍රකාශවල දෝෂ සහිත කරුණු සම්බන්ධයෙන් යම් පාර්ශ්වයක් එම පිළිගත් දේශපාලන පක්ෂයට, ස්වාධීන කණ්ඩායමට හෝ අපේක්ෂකයාට එරෙහිව පැමිණිලි කිරීමට අවශ්‍ය නම් ඒ සඳහා ඔහු සතුව පවතින සාක්ෂි ද සහිතව අදාළ අපේක්ෂකයා තරග කළ ප්‍රදේශයේ පොලිස් ස්ථානයට පැමිණිලි කළ හැකි ය. එසේ නැත්නම් අදාළ එම පැමිණිල්ල මැතිවරණ කොමිෂන් සභාවට භාර දුන් පසුව කොමිෂන් සභාව විසින් ශ්‍රී ලංකා පොලීසියේ මැතිවරණ කොට්ඨාසයට ඉදිරිපත් කරනු ඇත.

පැමිණිලි සම්බන්ධ ඉදිරි කටයුතු ශ්‍රී ලංකා පොලීසිය විසින් සෘජුව ඉටු කළ යුතු ය.

ආශ්‍රිත ග්‍රන්ථ

1. 2023 අංක 03 දරන මැතිවරණ වියදම් නියාමනය කිරීමේ පනත

ජනාධිපතිවරයා තේරීමේ විධික්‍රමය හා

කෙනත් ඇරෝ ගේ අභව්‍ය ප්‍රමේයය [3වන කොටස]

ආචාර්ය ජයන්ත සේනාධීර

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ගණිත අංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය

(මෙහි දෙවන කොටස 2024 වර්ෂයේ ජනවාරි - අප්‍රේල් කලාපයේ පළ කරන ලදී.)

කතිරයේ බලය පසුගිය කලාප දෙක තුළ අප සාකච්ඡාවට භාජනය කළේ කෙනත් ඇරෝ ගේ අභව්‍ය ප්‍රමේයය පිළිබඳවයි. සරලවම එය මනාප ලකුණු කිරීමක් මත පවත්වන ඡන්දයකදී "සාධාරණත්වයේ නිර්ණායක" සතරම තෘප්ත වන පරිදි ජයග්‍රාහකයා තෝරා ගැනීමේ නිශ්චිත පටිපාටියක් නොපවතී, ලෙස සඳහන් කළ හැක. මෙහි සඳහන් සාධාරණත්වයේ නිර්ණායක සතර වන්නේ, බහුතරයේ නිර්ණායකය, කොන්ඩොසෙට් නිර්ණායකය, ඒකාකාර භාවයේ නිර්ණායකය සහ අදාළ නොවන විකල්පයන්ගෙන් ස්වායක්ත භාවයේ නිර්ණායකය යන නිර්ණායක සතරයි. මේ පිළිබඳ අර්ථ දැක්වීම් හා පැහැදිලි කිරීම් පසුගිය කලාප දෙකේදී සාකච්ඡා කර ඇත.

මේ ප්‍රමේයය සාධනය කිරීම වෙනුවෙන් වර්ෂ එක් දහස් නමසිය හැත්තෑ දෙකේදී ඇමරිකානු ජාතික, ආර්ථික විද්‍යාඥයකු වූ කෙනෙත් ඇරෝට ආර්ථික විද්‍යාව පිළිබඳ නොබෙල් ත්‍යාගයද හිමි විය. කෙනත් ඇරෝගේ අභව්‍ය ප්‍රමේයය අපට වැදගත් වන්නේ, ශ්‍රී ලංකාවේ ජනාධිපතිවරයා තෝරා ගන්නා ක්‍රමවේදය ද මනාප ලකුණු කිරීම මත පදනම්ව තිබීම නිසාය. එසේ මනාප ලකුණු කළ ඡන්ද පත්‍රිකා ඇසුරින් ජනාධිපතිවරයා තෝරා ගන්නා ක්‍රියා පටිපාටිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 94 වන ව්‍යවස්ථාවෙන් විස්තර කෙරේ. එමෙන්ම එම 94 ව්‍යවස්ථාවේ ඇති ක්‍රියාපටිපාටිය මගින් සාධාරණත්වයේ ඉතා වැදගත්ම නිර්ණායකය වන බහුතරයේ නිර්ණායකය තෘප්ත වන බව පහසුවෙන්ම පෙනේ. කිසියම් අපේක්ෂකයකු වලංගු ඡන්ද සංඛ්‍යාවෙන් සියයට පනහකට වඩා ලබා ගතහොත් ඔහු අනිවාර්යයෙන්ම ජනාධිපතිවරයා විය යුතුය, යන නියමයෙන් මෙය තහවුරු වේ.

අපේක්ෂකයින් තිදෙනෙකු හෝ වැඩි ගණනක් සහභාගී වන ඡන්දයකදී, එක් අපේක්ෂකයකු සියයට පනහකට වඩා වැඩි ඡන්ද, එනම් ප්‍රථම මනාප ලබා නොගත් අවස්ථාවලදී ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන අනුව ජනාධිපතිවරයා තෝරා ගන්නා අන්දම අපි ග්‍රාම සංවර්ධන සමිතියක සභාපතිවරයා තෝරා ගන්නා ඡන්ද විමසීමක උදාහරණයක් මගින් පැහැදිලි කළෙමු. අද අපේ සාකච්ඡාවට බඳුන් වන්නේ සාධාරණත්වයේ දෙවන නිර්ණායකය වන කොන්ඩොසෙට් නිර්ණායකය පිළිබඳවයි. කොන්ඩොසෙට් නිර්ණායකය පිළිබඳව නැවත මතක් කිරීමක් කරන්නේ නම් "කිසියම් අපේක්ෂකයෙකු මනාප ලැයිස්තුවේ අනෙකුත් එක් එක් අපේක්ෂකයන් සමඟ යුගල වශයෙන් මුහුණට මුහුණ සංසන්දනයේදී එම සමස්ත යුගල සැසඳීම තුල ඔහුට සංඛ්‍යාත්මක වැඩිම ජයග්‍රහණ ප්‍රමාණය හිමිවන්නේ නම් ඔහු හෝ ඇය ජයග්‍රාහකයා වීම" යන්නයි. විශේෂයෙන්ම අපේ 94 වන ව්‍යවස්ථාවේ ක්‍රියා පටිපාටිය කොන්ඩොසෙට් නිර්ණායකය සපුරන්නේ ද යන්න පිළිබඳව අද සාකච්ඡාවට භාජනය වෙනවා.

ප්‍රංශ ජාතික ගණිතඥයකු හා දාර්ශනිකයකු වූ මාකස් ඩි කොන්ඩොසෙට් මේ පිළිබඳව වැඩි අවධානයක් යොමු කළ පුද්ගලයායි. එම නිර්ණායකයට ඔහුගේ නම ලැබුනේ ඒ නිසයි. මනාප ක්‍රමය යටතේ පවත්වන සෑම මැතිවරණයක් අවසානයේදීම කොන්ඩොසෙට් නිර්ණායකය සපුරණ තනි අපේක්ෂකයෙකු සිටීම අනිවාර්යයක් නොවේ. නමුත් කොන්ඩොසෙට් නිර්ණායකය සපුරන්නෙකු සිටියොත් ඔහු ජයග්‍රාහකයා කලයුතු බවට සාධාරණ තර්කයක් මතු කළ හැක. දැන් අපි 94 වන ව්‍යවස්ථාවට අනුව, සලකුණු කරනු ලබන මනාපය අනුව ජනාධිපතිවරයා තෝරන ක්‍රියා පටිපාටිය කොන්ඩොසෙට් නිර්ණායකය සපුරන්නේ දැයි බලමු. එනම් කොන්ඩොසෙට් ජයග්‍රාහකයෙකු සිටියොත් ඔහු අනිවාර්යයෙන්ම ජනාධිපති වන්නේ දැයි බලමු, නැවතත් පෙර ග්‍රාම සංවර්ධන සමිතියේම නව ඡන්ද විමසීමක් උදාහරණයට ගනිමු. මෙවරද අමරපාල (A), බන්දුපාල(B), කරුණාපාල(C) හා ධර්මපාල(D) නැමැති අපේක්ෂකයන් සිව් දෙනා තරඟ වැදුනහ. සමිතියේ සාමාජිකයින් හතලිස් දෙනෙකු ඡන්දය ලබාදුන් අතර හතළිස් දෙනාම 1, 2, 3 මනාප තුනම සළකුණු කර ඇතැයි උපකල්පනය කරමු. මනාපයක් සලකුණු නොවී ඇති අපේක්ෂකයාට හිමිවන්නේ හතරවන ස්ථානය (හතර වන මනාපය) බව ඉතාම පැහැදිලියි. **1 වන වගුව** මඟින් දක්වා ඇත්තේ ඒ ඡන්ද පත්‍රිකා 40 යි.

මේ සියලු ඡන්ද පත්‍රිකා පහත ආකාරයට ගොඩවල් හතරකට වර්ග කළ හැක. **එය 2 වන වගුව මඟින් දක්වා ඇත.**

දැන් 94 ව්‍යවස්ථාවේ ක්‍රියාපටිපාටියට අනුව ජයග්‍රාහකයා කවුදැයි විමසා බලමු. කිසියම් තරඟ කරුවෙකු විසින්

බහුතරය, එනම් පළමු මනාප 20 කට වඩා ලබා ගෙන නැත. එබැවින් දෙවන තුන්වන මනාප විශ්ලේෂණයට යා යුතුය. A පළමු මනාප 14ක් ද, B පළමු මනාප 12 ක් ද ලබා වැඩිම පළමු මනාප ලැබූ තරග කරුවන් දෙදෙනා බවට පත් වී ඇත. එබැවින් ඒ දෙදෙනා හැර අනෙක් අය තරගයෙන් ඉවත් කරනු ලැබේ. දැන් C ට හෝ D ට පළමු මනාපය සලකුණු කර ඇති ඡන්ද පත්‍රිකා වල A ට හෝ B ට දෙවන මනාපය සලකුණු කර ඇත්දැයි බලනු ලැබේ. එම ඡන්ද පත්‍රිකා 14 අතුරින් 6 ක් B ට දෙවන මනාපය ලබා දී ඇති අතර A ට කිසිවෙකු දෙවන මනාපය ලබා දී නැත. ඒ අනුව දෙවන මනාපය ගණනය කිරීමෙන් පසු A ගේ ඡන්ද සංඛ්‍යාව 14 ම වන අතර B ගේ ඡන්ද සංඛ්‍යාව 18 දක්වා ඉහළ යයි. දැන් B ට දෙවන මනාපය ලකුණු කළ එම ඡන්ද පත්‍රිකා 6 ද ඉවත් කර ඉතිරි ඡන්ද පත්‍රිකා 8 හි, A ට හෝ B ට තුන්වන මනාපය ඇත්නම් ඒවා ගණනය කරනු ලැබේ. එම ඡන්ද පත්‍රිකා අටේම තුන් වන මනාපය B ට ලබා දී ඇති බැවින් අවසානයේ දෙවන, තුන්වන මනාපද ගණන් කළ පසු

A	1	1	1	1	1	1	1	1	1	1
B	3	3	3	3	3	3	3	3	3	3
C	2	2	2	2	2	2	2	2	2	2
D										

A	1	1	1	1						
B	3	3	3	3	1	1	1	1	1	1
C	2	2	2	2	2	2	2	2	2	2
D					3	3	3	3	3	3

A							3	3	3	3
B	1	1	1	1	1	1	2	2	2	2
C	2	2	2	2	2	2	1	1	1	1
D	3	3	3	3	3	3				

A	3	3								
B	2	2	3	3	3	3	3	3	3	3
C	1	1	2	2	2	2	2	2	2	2
D			1	1	1	1	1	1	1	1

වගුව - 1

A	1		3	
B	3	1	2	3
C	2	2	1	2
D		3		1
	14	12	6	8

වගුව - 2

A ට ඡන්ද 14 ක් හා B ට ඡන්ද 26 ක් ලැබී ඇත. ඒ අනුව 94 ව්‍යවස්ථාවේ පටිපාටියට අනුව ජයග්‍රාහකයා B වේ.

දැන් කොන්ඩොසෙට් ජයග්‍රාහකයෙක් සිටීද? එසේ සිටී නම් ඒ කවරෙකුදැයි තීරණය කිරීමට (A,C), (B,C), (C,D), (A,B), (A,D) හා (B,D) යුගල වශයෙන් සලකා එක් එක් ඡන්ද පත්‍රිකාවල එම යුගලයේ ජයග්‍රාහකයා කවුදැයි තීරණය කර ගණනය කිරීම සිදු කල යුතුය. ඒ අනුව, ඡන්ද පත්‍රිකා විශ්ලේෂණයෙන්;

(A ,C) යුගලයෙන් A - 14, C - 26, එබැවින් ජයග්‍රාහකයා C.
(B, C) යුගලයෙන් B - 12, C - 28, එබැවින් ජයග්‍රාහකයා C.
(C, D) යුගලයෙන් C - 32, D - 08, එබැවින් ජයග්‍රාහකයා C.
(A, B) යුගලයෙන් A - 14, B - 26, එබැවින් ජයග්‍රාහකයා B.
(A, D) යුගලයෙන් A - 20, D - 20, දෙදෙනාම සමයි.
(B, D) යුගලයෙන් B - 32, D - 08, එබැවින් ජයග්‍රාහකයා B.
බව ලැබේ. ඒ අනුව මුළු තරග 6 න්, C තරග තුනක් ජයගෙන ඇත.

ඒ අනුව පැහැදිලි කොන්ඩොසෙට් ජයග්‍රාහකයෙක් සිටින අතර ඔහු C එනම් කරුණාපාල වේ. එබැවින් 94 ව්‍යවස්ථාව අනුව සමිතියේ සභාපති වරයා වන්නේ බන්දුපාල (B) වුවත්, කොන්ඩොසෙට් ජයග්‍රාහකයා වන්නේ කරුණාපාල (C) බැවින්, ඔහු සභාපති විය යුතු යැයි කෙනෙකුට තර්ක කළ හැක. මින් පෙනෙන්නේ අපේ 94 ව්‍යවස්ථාව, සාධාරණත්වයේ දෙවන නිර්ණායකය වන කොන්ඩොසෙට් නිර්ණායකය තෘප්ත නොකරන අවස්ථා පැවතිය හැකි බවයි.

94 ව්‍යවස්ථාව සාධාරණත්වයේ ඉතිරි නිර්ණායක දෙක තෘප්ත කරන්නේ ද, නැත් ද යන වග ඉදිරි කලාප මගින් සාකච්ඡා කරමු.

ආශ්‍රිත ග්‍රන්ථ

1. Excursions of Modern Mathematics - Peter Tannenbaum - 2009

2. ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

ඉදිරි ජනාධිපතිවරණය සහ එහි වැඩකටයුතු පිළිබඳව මැතිවරණ කොමිසමේ සභාපතිවරයාගේ ප්‍රධානත්වයෙන් මැතිවරණ මහලේකම් කාර්යාලයේ පැවති මාධ්‍ය හමුව - 2024.07.16

European Union Ambassador HE Carmen Moreno and the European Union Exploratory mission had a discussion with the Election Commission on 29.05.2024 at 3.00p.m at the Election Secretariat.

මැතිවරණ මෙහෙයුම් සැලැස්ම සකස් කිරීම පිළිබඳව 2024 මැයි 21 දින බදුල්ල දිස්ත්‍රික්කයේ පැවැත්වූ වැඩමුළුව

Ambassador of the United States of America to Sri Lanka, Julie Chung had a discussion with Mr.R.M.A.L. Rathnayake, Chairman of the Election Commission at the Election Secretariat - 28th May 2024

Mr.Marc-André Franche, the Resident Coordinator of the United Nations in Sri Lanka was accompanied by Mr. Patrick McCarthy, (Peace and Development Advisor) and Ms. Nethmini Medawala, (Peace and Development Analyst), met the Chairman of the Election Commission, Mr.R.M.A.L. Rathnayake, at the Election Commission Secretariat - 13th May 2024

මැතිවරණ ක්‍රියාවලිය පිළිබඳව සංවර්ධන නිලධාරීන් දැනුම්වත් කිරීමේ වැඩමුළුව 2024 මැයි 9 හා 10 දින කොළඹ දී පවත්වන ලදී

පොසොන් උත්සවය නිමිති කොට ගෙන මැතිවරණ කොමිෂන් සභාවේ ප්‍රවාහන අංශය විසින් ප්‍රථම වරට සංවිධානය කළ පොසොන් බැති ගී සරණියේ විශේෂ අවස්ථා - 2024 ජුනි 27

උපදේශක මණ්ඩලය

ආර්.එම්.ඒ.එල්. රත්නායක - සභාපති
එම්.ඒ.පී.සී. පෙරේරා - සාමාජික
අමීර් ෆායිස් - සාමාජික
අනුසූයා ෂන්මුගනාදන් - සාමාජික
මහාචාර්ය ලක්ෂ්මන් දිසානායක - සාමාජික
සමන් ශ්‍රී රත්නායක - මැතිවරණ කොමසාරිස් ජනරාල්
එච්.එම්.ටී.ඩී. හේරත් - ලේකම්
රසික පීරිස් - අතිරේක මැතිවරණ කොමසාරිස් (ජාතික මැතිවරණ)

සංස්කරණය

චන්න පී. ද සිල්වා
(අධ්‍යක්ෂ, පර්යේෂණ හා ක්‍රමසම්පාදන)

පරිගණක පිටු සැකසුම

අමිල ගමගේ (මැතිවරණ කොමිෂන් සභාව)

මුද්‍රණය

රජයේ මුද්‍රණාලය

ප්‍රකාශනය

නීති, විමර්ශන හා සැලසුම් ශාඛාව,
මැතිවරණ කොමිෂන් සභාව

ඔබගේ අදහස් හා යෝජනා අපට ලියන්න

සංස්කාරක
කතිරයේ බලය
මැතිවරණ කොමිෂන් සභාව,
මැතිවරණ මහලේකම් කාර්යාලය,
02, සරණ මාවත,
රාජගිරිය,
ශ්‍රී ලංකාව.

(+94)112868441-42-43 (+94)112868426 info@elections.gov.lk www.elections.gov.lk elecomsl SriLankaElectionCommission Election Commission of Sri Lanka

මෙම සඟරාවේ ලිපිවල සඳහන් කරුණු පිළිබඳව වගකීම ඒ ඒ ලේඛකයා සතු වන අතර, ලිපිවල ඇතුළත් කරුණුවලින් මැතිවරණ කොමිෂන් සභාවේ අදහස් ප්‍රකාශ නොවේ. මෙහි ඇතුළත් කරුණු, උපුටා පළ කිරීමට අපේක්ෂා කරන්නේ නම් ඒ සඳහා මැතිවරණ කොමිෂන් සභාවේ පූර්ව අනුමැතිය ලබා ගත යුතු ය.